# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය Date - 2026.04.17 පැය 0545 | දුරකථන අංකය Tel.NO - 011-2887973 | මගේ අංකය My NO - D/Media/Out/ 619 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails - dir.media@police.gov.lk


<u>**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු.**</u>

*பொலிஸ் ஊடகப் பிரிவுக்கு அறியப்பட்ட முக்கிய தகவல்கள்:*

**01. මනුෂ්‍ය ඝාතනයක් - වටවල පොලිස් වසම.**

2026.04.17 දින අළුයම් කාලයේ වටවල පොලිස් වසමේ වැලිඔය වත්ත ප්‍රදේශයේදී තියුණු ආයුධයකින් පහරදී තුවාල ලැබූ කාන්තාවක් වටවල රෝහලට ඇතුලත් කරන විටත් මියගොස් ඇති බවට වටවල පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය අවුරුදු 28 ක් වූ වැලිඔය වත්ත, හැටන් ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

ඝාතනය සිදුකල පුද්ගලයින් හා ඝාතනයට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැති අතර වටවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***மனிதப் படுகொலை - வட்டவல பொலிஸ் பிரிவு***

*2026.04.17 அதிகாலை வட்டவல பொலிஸ் பிரிவிற்குட்பட்ட வெலிஓய தோட்டப் பகுதியில் கூர்மையான ஆயுதத்தால் தாக்கப்பட்டு காயமடைந்த ஒரு பெண் வட்டவல மருத்துவமனைக்கு கொண்டு செல்லப்பட்ட போது அவர் ஏற்கனவே உயிரிழந்துள்ளதாக அறிவிக்கப்பட்டது. இதன் அடிப்படையில் விசாரணை ஆரம்பிக்கப்பட்டுள்ளது.*

*உயிரிழந்தவர் 28 வயதுடைய வெலிஓய தோட்டம், ஹட்டன் பகுதியைச் சேர்ந்தவர்.*

*குற்றவாளிகள் மற்றும் காரணம் இதுவரை கண்டறியப்படவில்லை. மேலதிக விசாரணைகள் வட்டவல பொலிஸாரால் மேற்கொள்ளப்படுகின்றன.*

## 02. නීති විරෝධි මත්පැන් හා ගෝඩා සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මිනුවන්ගොඩ පොලිස් වසම.

2026.04.16 දින දහවල් මිනුවන්ගොඩ පොලිස් වසමේ කොටුගොඩ හා හපුවලාන ප්‍රදේශවලදී මිනුවන්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදුකර **නීති විරෝධි මත්පැන් ලීටර් 90 (බෝතල් 120) ක් හා නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 1080 ක් (බැරල් 06) සමඟ සැකකරුවෙකුද, නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 1070 ක් (බැරල් 06) සමග සැකකරුවෙකුද** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 41 හා 44 වයස්වල පසුවන කොටුගොඩ හා මරදගහමුල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මිනුවන්ගොඩ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### *சட்டவிரோத மதுபானம் மற்றும் கோடா உடன் இருவர் கைது - மினுவாங்கொட பொலிஸ் பிரிவு.*

*2026.04.16 மினுவாங்கொடை பொலிஸ் பிரிவிற்குட்பட்ட கொட்டுகொட மற்றும் ஹப்புவலான பகுதிகளில் மேற்கொண்ட சோதனையில் சட்டவிரோத மதுபானம் 90 லீட்டர் (120 பாட்டில்கள்) மற்றும் 1080 லீட்டர் கோடா உடன் ஒருவர், மேலும் 1070 லீட்டர் கோடா உடன் மற்றொருவர் கைது செய்யப்பட்டனர்.*

*சந்தேகநபர்கள் 41 மற்றும் 44 வயதுடைய கொட்டுகொட மற்றும் மரதகஹமுல்ல பகுதிகளைச் சேர்ந்தவர்கள்.*

*மேலதிக விசாரணைகள் மினுவாங்கொட பொலிஸாரால் மேற்கொள்ளப்படுகின்றன.*

## 03. නීති විරෝධි මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - යක්කල පොලිස් වසම.

2026.04.16 දින දහවල් යක්කල පොලිස් වසමේ අමුණුගොඩ ප්‍රදේශයේදී යක්කල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධි මත්පැන් ලීටර් 67.5 (බෝතල් 90) ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු අවුරුදු 48 ක් වන ගණේමුල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

යක්කල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### *சட்டவிரோத மதுபானம் உடன் ஒருவர் கைது - யக்கல பொலிஸ் பிரிவு*

*2026.04.16 யக்கல பொலிஸ் வரம்பிற்குட்பட்ட அமுனுகொட பகுதியில் மேற்கொண்ட சோதனையில் சட்டவிரோத மதுபானம் 67.5 லீட்டர் (90 பாட்டில்கள்) உடன் ஒருவர் கைது செய்யப்பட்டார்.*

*சந்தேகநபர் 48 வயதுடைய கானேமுல்ல பகுதியைச் சேர்ந்தவர்.*

*மேலதிக விசாரணைகள் யக்கல பொலிஸாரால் மேற்கொள்ளப்படுகின்றன.*

**04. ගල් ඉබ්බන් 10 දෙනෙකු සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පුත්තලම කොට්ඨාස දූෂණ මර්ධන අංශය.**

2026.04.16 දින දහවල් පුත්තලම පොලිස් වසමේ කරඹ ප්‍රදේශයේදී පුත්තලම කොට්ඨාස දූෂණ මර්ධන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර ගල් ඉබ්බන් 10 දෙනෙකු සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන පුත්තලම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරුවන් අවුරුදු 26 වයසේ පසුවන පුත්තලම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

පුත්තලම පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

***10 கல் ஆமைகளை வைத்திருந்த இருவர் கைது - புத்தளம் மாவட்ட குற்றத் தடுப்பு பிரிவு***

*2026.04.16 புத்தளம் பொலிஸ் பிரிவிற்குட்பட்ட கரம்ப பகுதியில் மேற்கொண்ட சோதனையில் 10 ஆமைகளை வைத்திருந்த இருவர் கைது செய்யப்பட்டு புத்தளம் பொலிஸ் நிலையத்தில் ஒப்படைக்கப்பட்டுள்ளனர்.*

*சந்தேகநபர்கள் 26 வயதுடைய புத்தளம் பகுதியைச் சேர்ந்தவர்கள்.*

*மேலதிக விசாரணைகள் புத்தளம் பொலிஸாரால் மேற்கொள்ளப்படுகின்றன.*

**05. දියේ ගිලී කාන්තාවක් හා පුද්ගලයෙකු මියගොස් තවත් පුද්ගලයින් හය දෙනෙකු අතුරුදන් වීම සම්බන්ධව - කොබෙයිගනේ පොලිස් වසම.**

2026.04.16 දින සවස කොබෙයිගනේ පොලිස් වසමේ දැදුරුඔය කුරිටියාගහමුල මංකඩේ දිය නාමින් සිටි පිරිසක් දියේ ගිලී අතුරුදන් වී ඇති බවට කොබෙයිගනේ පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

මෙහිදී පිරිමි පුද්ගලයින් සිව්දෙනෙකු, කාන්තාවන් තිදෙනෙකු හා පාසල් දරුවන් තිදෙනෙකු දියේ ගිලී ඇති අතර ඉන් එක් පුද්ගලයෙකු හා කාන්තාවක් බේරාගෙන නිකවැරටිය රෝහලට ඇතුලත් කර ඇත. එක් කාන්තාවකගේ සහ එක් පිරිමි පුද්ගලයෙකුගේ මෘත ශරීර සොයාගෙන ඇති අතර තවත් පිරිමි පුද්ගලයින් දෙදෙනෙකු, කාන්තාවක් සහ පාසල් ළමුන් තිදෙනෙකු අතුරුදන් වී ඇත.

**මරණකරු අවුරුදු 70 සහ මරණකාරිය අවුරුදු 34 වයස්වල පසු වූ කොබෙයිගනේ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ. අතුරුදන් වූ පිරිමි පුද්ගලයින් අවුරුදු 39 සහ 72 ක්, කාන්තාව අවුරුදු 42 ක් සහ පාසල් ළමුන් අවුරුදු 09, 13 සහ 18 වයස්වල පසු වූ කොබෙයිගනේ සහ උඩවෙල ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මරණකරු, මරණකාරිය සහ අතුරුදන්වූවන් කඩවත ප්‍රදේශයේ සිට පැමිණි ඥාති පිරිසක් සමඟ කුරිටියාගහමුල මංකඩේ දිය නාමින් සිටියදී මෙලෙස අනතුරට ලක්ව ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

අතුරුදන්වූවන් සොයා කොබෙයිගනේ පොලිසිය විසින් ප්‍රදේශවාසීන්ගේ හා නාවික හමුදා කිමිදුම් නිලධාරින්ගේ සහය ඇතිව සෝදිසි මෙහෙයුම් තව දුරටත් සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**

**நீரில் மூழ்கி ஆண் மற்றும் பெண் உயிரிழப்பு, மேலும் ஆறு பேர் காணாமல் போன சம்பவம் – கொபேகனே பொலிஸ் பிரிவு.**

2026.04.16 மாலை கொபேகனே பொலிஸ் பிரிவிற்குட்பட்ட தெதுருஓயா குரிடியகஹமுல பகுதியில் குளித்துக்கொண்டிருந்த குழுவினர் நீரில் மூழ்கியதாக தகவல் கிடைத்துள்ளது.

இதில் 4 ஆண்கள், 3 பெண்கள் மற்றும் 03 பாடசாலை மாணவர்கள் உள்ளிட்டோர் நீரில் மூழ்கியுள்ளனர். ஆண் மற்றும் பெண் ஒருவர் மீட்கப்பட்டு நிக்கவெரட்டிய மருத்துவமனைக்கு அனுப்பப்பட்டுள்ளனர்.மேலும், ஆண் மற்றும் பெண் உயிரிழந்த நிலையில் கண்டுபிடிக்கப்பட்டுள்ளனர். மேலும் 2 ஆண்கள், 1 பெண் மற்றும் 3 மாணவர்கள் காணாமல் போயுள்ளனர்.

உயிரிழந்தவர் 70 வயது ஆண் மற்றும் 34 வயது பெண்; காணாமல் போனவர்கள் 39, 72 வயது ஆண்கள், 42 வயது பெண் மற்றும் 9, 13, 18 வயது பாடசாலை மாணவர்கள் ஆவர்.

இவர்கள் கடவத்த பகுதியில் இருந்து வந்த உறவினர்கள் என்பது விசாரணையில் தெரியவந்துள்ளது.

மேலதிக தேடுதல் நடவடிக்கைகள் பொலிஸார், பொதுமக்கள் மற்றும் கடற்படை உதவியுடன் நடைபெற்று வருகின்றன.

**பொலிஸ் ஊடகப் பிரிவு**